සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක:- 14 / 2026

මගේ අංකය:- PPSC/ES/14/FI/06/3-2
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නව නගරය - රත්නපුර
2026.05. 07

1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව

2. ලේකම්, සමාජ සුභසාධන,පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව

3. අධ්‍යක්ෂ, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව, සබරගමුව පළාත් සභාව

**සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි I වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 ජූනි**

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු **I වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්** වෙතින් උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම චක්‍රලේඛ ලිපිය සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ I වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ **දැනගැනීම සඳහා වහාම යොමු කරන්න.** ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුයුක්ත කර සිටින නිලධාරීන්ගේ දැනගැනීම සඳහා ද මෙය යැවිය යුතු වේ. අයදුම්කරුවන් ඉදිරිපත්ව නොමැති නම් විභාගයේ ඉදිරි කටයුතු කිරීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳව ද කඩිනමින් මා දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි. **මෙම චක්‍රලේඛය හා අයදුම්පත්‍රය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියෙහි** www.psc.sg.gov.lk සහ සබරගමුව පළාත් වෙබ් අඩවියෙහි www.sg.gov.lk පළ කර ඇත.

02. අදාළ බඳවා ගැනීමේ පරිපාටියට අනුව මෙම විභාගයේ විෂයය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ව්‍යාපෘති කළමනාකරණය | i. ව්‍යාපෘතියක් යන්න නිර්වචනය කිරීම<br>ii. ව්‍යාපෘති කළමනාකරණය<br>iii. ව්‍යාපෘති චක්‍රය<br>iv. ව්‍යාපෘති පිළියෙල කිරීම සහ විග්‍රහ කිරීම<br>v. ව්‍යාපෘති ඇගයීම<br>➢ පිළිගෙවුම් කාලය<br>➢ ශුද්ධ වර්තමාන වටිනාකම<br>➢ අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය<br>➢ පිරිවැය ප්‍රතිලාභ අනුපාතය<br>➢ වාර්ෂික සාමාන්‍ය ඉපැයුම් අනුපාතය<br>vi. ව්‍යාපෘති සංවිධානය<br>vii. ණයා මිළ යොදා ගැනීම | පැය 03 | 100 | 40 |

03. **විභාගයට අයදුම් කිරීම -** අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙළ කර ගත යුතු අතර, ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් **2026.06.07** දින හෝ ඊට පෙර මෙම කාර්යාලය වෙත ලැබෙන සේ යොමු කළ යුතු ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. මින්පෙර පෙර I වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිට එම අවස්ථාවේ විභාගය අසමත් වී නැවත අයදුම් කරන්නේ නම් එක් විෂයකට රු .250/- හා සමස්ත විභාගය සඳහා රු. **600/-**ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු වේ. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** දරන ආදායම් ශීර්ෂයට බැර වන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. එම මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පිටුපස නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

05. විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට විභාගය පවත්වන දිනය, ස්ථානය හා වේලාව විභාග ප්‍රවේශ පත්‍ර මගින් යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

06. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ඩබ්.ආර්.දිනිෂා එස්.රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

ඩබ්.ආර්. දිනිෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ I ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 ජූනි**

01. (a) මුලකුරු සමඟ නම:-

.................................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(b) සම්පූර්ණ නම:-

.................................................................................................................................

(c) මුලකුරු සමඟ නම:-

.................................................................................................................................

(d) රාජකාරී ලිපිනය:-

.................................................................................................................................

(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

(e) ස්ත්‍රී / පුරුෂ භාවය:-.........................................................................

(f) දුරකථන අංකය පෞද්ගලික:- ........................................................

(g) දුරකථන අංකය රාජකාරී :- ........................................................

(h) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ වර්ෂය-.................................................

(i) දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ වර්ෂය-.................................................

(j) තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටි වාර ගණන-.................................

02. ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

03. උපන් දිනය:- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

04. ඔබ ග්‍රාම සංවර්ධන නිලධාරි I ශ්‍රේණියට උසස් වූ දිනය:-.........................................................

05. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බව ද ප්‍රකාශ කරමි.

දිනය:- 2026.

........................................................

(අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන)

---

ඉහත නම් සඳහන් අපේක්ෂකයාට විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ඇති/නැති බව නිර්දේශ කරමි. (නිර්දේශ නොකරන්නේ නම් හේතු දක්වන්න.)

.............................................

දිනය :- 2026.

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ
අත්සන හා පදවි නාමය
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)